

# කොහුබත්

**රටක සංවර්ධන ක්‍රියාවලියවට කෘෂි කාර්මික හා සේවා අංශයේ දයකත්වයට වඩා කාර්මික අංශය වැඩි දයකත්වයක් ලබාදේ. ශ්‍රී ලංකාව වැනි තුන්වන ලෝකයේ රටවල කාර්මික අංශය තුළ ගෘහ කර්මාන්ත මධ්‍ය පරිමාණ කර්මාන්ත හා මහා පරිමාණ කර්මාන්ත වලින් ප්‍රබල දයකත්වයක් ලබාදේ.**

නිරෝෂා කරුණාතිලක
කොළඹ විශ්ව විද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයන අංශය

කර්මාන්ත ව්‍යූහය තුළ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල දයකත්වය කැපී පෙනේ. කොහු කර්මාන්තය කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ලෙස අද වන විට ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇත.

ශ්‍රී ලංකාව තුළ වසරකට පොල් ගෙඩි මිලියන 2000 ක් නිෂ්පාදනය වේ. කොහු කර්මාන්තය සඳහා පොල් ලෙලිවලින් 3/1 ක් යොද ගැනේ. පොල් ලෙල්ලක සාමාන්‍ය බර ග්‍රෑම් 350 ක් වේ. මෙයින් ග්‍රෑම් 140 ක් කොහුවලින් හා ග්‍රෑම් 210 ක් කොහුබත්වලින් සමන්විත වේ. ශ්‍රී ලංකාවේ වාර්ෂික කොහු නිෂ්පාදනය ටොන් 100000 ක් පමණ වේ.

පොල්ගත ආශ්‍රයෙන් පවතින කර්මාන්ත අතරින් කොහු කර්මාන්තය අතීතයේ සිටම වැදගත් තැනක් හිමි කර ගෙන ඇත. කොහු කර්මාන්තයෙන් ඉවතලන කොහුබත් ප්‍රයෝජනයට නොගැනීම නිසා කොහු කර්මාන්ත ආශ්‍රිත අපද්‍රව්‍යයක් ලෙස කොහුබත් ඉවත දමා තිබුණි.

පාරිසරිකව විශාල හානියක් පවතින කොහු බත් වර්ෂාව සමග ඉහළ නැගෙන ජල තට්ටුව දක්වා ජලය කාන්දුවීමේ දී ළිං හා ජලාශවල ජලය අපිරිසිදු වීමට හේතුවීම ප්‍රබල පාරිසරික ගැටලුවකි. මේ තත්ත්වය මත කොහුබත් කඳු ගිනි තැබීම සිදුකරයි.

වියළි කලාපීය ප්‍රදේශවල අධික සූර්යතාපය නිසා වගා බිම්වල ජලය වාෂ්පවීම වළක්වා රඳවා තබා ගැනීමේ ක්‍රමයක් ලෙස කොහුබත් භාවිතයට ගැනුණි. අන්නාසි, පොල් හා කෙසෙල් වගාවන් සඳහා මේ ක්‍රමය බහුලව යොදගන්නා ලදී. නමුත් වාර්ෂිකව ඉවත දමන කොහුබත්වලින් වගා බිම්වල අවශ්‍යතාවට වඩා වැඩි ප්‍රමාණයක් කොහු කර්මාන්තශාලා අසල ගොඩ ගසා තිබීම නිසා කොහුබත්වලින් ලබා ගත හැකි අතුරු ප්‍රයෝජන කෙරෙහි අවධානය යොමු විය. අද වන විට කොහුබත්වල විභවතාවන් හඳුනා ගැනීමත් එහි ජනප්‍රියභාවය වැඩිවීමත් සමඟ ඒවාට ඉහළ ඉල්ලුමක් පවතියි. ඒ සමඟ ම ලෝක වෙළෙඳපොළෙහි කොහුබත් අපනයනය කරන ප්‍රධාන රටක් බවට ශ්‍රී ලංකාව පත්ව තිබේ. කොහුබත් කර්මාන්තය තුළින් ග්‍රාමීයව සෘජු හා වක්‍රාකියා අවස්ථා විශාල ප්‍රමාණයක් උත්පාදනය වී තිබීම සතුටට කරුණකි.

## පොල්ගසෙහි ඉතිහාසය

පොල් ඝර්මකලාපයේ වැවෙන තාල වර්ගයට අයත් ශාකයකි. Cocose Nivisefera යන උද්භිද විද්‍යාත්මක නාමයෙන් හඳුන්වයි. පොල් ගසෙහි උපත එද සිදු වූයේ ඉන්දුනීසියාවේ ය. ශ්‍රී ලංකාවේ පොල් ගස කවුරු විසින් රැගෙන ආවාද , නැත්නම් එහි ආරම්භය කෙසේ ඇතිවූවා දැයි යන්න නිශ්චිතව සදහන් වී නොමැත. උණුසුම් හා ශීත දියවැල්වල බලපෑම මගින් ශ්‍රී ලංකාව වෙරළබඩ ප්‍රදේශවල ව්‍යාප්තිය සිදුවන්නට ඇත.

> **පාරිසරිකව විශාල හානියක් පවතින කොහු බත් වර්ෂාවන් සමඟ නැගෙන ජල තට්ටුව දක්වා ජලය කාන්දුවීමේ දී ළිං හා ජලාශවල ජලය අපිරිසිදු වීමට හේතුවීම ප්‍රබල පාරිසරික ගැටලුවකි. මේ තත්ත්වය මත කොහුබත් කඳු ගිනි තැබීම සිදුකරයි.**

අතීත පුරාවෘත්තවලට අනුව 1 වන අක්බෝ රජතුමා විසින් වැලිගම සිට දෙවුන්දර දක්වා පොල් වගා කරන ලද බව සඳහන් වේ. 1 වැනි මහා පරාක්‍රමබාහු රජතුමා විසින් ද පොළොන්නරුවේ නන්දන උයන කරවා පොල් වගා කර තිබේ. 11 වැනි පරාක්‍රමබාහු රජතුමා දේව ප්‍රතිරාජ නම් ඇමති ලවා කළුතර සිට බෙන්තර දක්වා පොල් වත්තක් ඇති කළ බව සඳහන් වේ.

ලන්දේසි යුගය තුළ හලාවත සිට දෙවුන්දර දක්වා මුහුදුබඩ ප්‍රදේශ ආවරණය වන පරිදි පොල් වගා කර තිබේ. පොල් වගාවේ ව්‍යාප්තිය සමඟ ලන්දේසින් තුන්හවුල් බදු ක්‍රමයක් ඇති කර තිබේ. ලන්දේසි යුගයේ දී පොල් මගින් විවිධ අතුරු නිෂ්පාදන සිදු කර තිබේ. මත්පැන්, කොහු ලණු ඇඹරීම හකුරු නිෂ්පාදනය, තෙල්, රසකැවිලි, කොප්පරා හා පුන්නක්කු සඳහා ඔවුහු පොල් යොද ගත්හ.

ශ්‍රී ලංකාව තුළ වෙරළබඩ ආශ්‍රිත පොල් වගාව, විශාල වශයෙන් ව්‍යාප්තියක් දැකිය හැකිය. අද වන විට වයඹ පළාත තුළ පොල් ව්‍යාප්තිය විශාල වශයෙන් දැකිය හැකිය. සාපේක්ෂව අනෙක් පළාත්වලට

## කොහුබත්වලින් ලැබිය හැකි ප්‍රයෝජන

කොහු කර්මාන්තයෙන් ඉවත දමන අපද්‍රව්‍යයක් ලෙස සැලකෙන කොහුබත්වල වැදගත්කම අද වන විට වර්ධනය වී ඇත. 1974 දී පමණ ශ්‍රී ලංකාවේ කොහුබත්වලින් ලබාගත





හැකි ප්‍රයෝජන සීමිත වූ අතර කොහුබත් ආශ්‍රිතව උත්පාදිත වක්‍ර හා සෘජු රැකියා අවස්ථා සීමිත විය. පොල්, අන්නාසි හා කෙසෙල් වගා සඳහා ජල ආරක්ෂිත මාධ්‍යයක් ලෙස පමණක් කොහුබත් යොදගෙන තිබේ. පිලිපීනයේ දූපත් වැසියන් කොහුබත්වලින් ඝනවූත් සවිමත් වූත් තහඩු සකස්කර ගෙවල සිවිලිත් සකස් කිරීමට හා කාමර වෙන් කිරීමට යොද ගෙන ඇත. ඊට අමතරව වගුරුබිම් පිරවීමට ද පොල් ලෙලි දැල්මත අතුරන මඩ සමඟ මිශ්‍ර කර ප්‍රයෝජනයට ගැනීමට ද පුරුදුව සිටියහ.

කොහුබත් පැළ සිටුවීම සඳහා සුදුසු මාධ්‍යයක් ලෙස අද ජනප්‍රිය වෙමින් පවතී. අඩු තෙතමනය සහිත වියළි වාතයක් පවතින සෞම්‍යකලාපීය පරිසරවල පසෙහි තෙතමනය රඳවා තබා ගැනීම සඳහා කොහුබත් පයට යෙදීමෙන් දෛනික ජප අවශ්‍යතා අවම කර ගත හැකි වේ.

රෝපණ මාධ්‍යයක් ලෙස ද කොහුබත් යොද ගනියි. විශේෂයෙන් විසිතුරු මල් වර්ග පහසුවෙන් ;රෝපණය කිරීමට (රෝස කානේෂන්, ක්‍රෝටන්, සපත්තු මල් ) සුදුසු මාධ්‍යයක් ලෙස කොහුබත් යොද ගනියි.

උද්‍යානකරණය හා බිංදු ජල සම්පාදනය (Drip Imigation)සඳහා කොහුබත් හා පොල් ලෙලි සාර්ථක ලෙස යොද ගනියි.

ඊට අමතරව බලශක්ති නිෂ්පාදනය කිරීම, රබර් මිශ්‍ර කර ගැස්කට් (Gaskets) නිෂ්පාදනය ජල ප්‍රතිරෝධක භාණ්ඩ සෑදීම, තහඩු නිෂ්පාදනය සඳහා කොහුබත් යොද ගනියි.

නාගරික ප්‍රදේශවල භූමිය ප්‍රබල ගැටලුවකි. පස නොමැතිව පැළ සිටුවීමේ ක්‍රමයක් ලෙස ජලයට පෝෂක ද්‍රව්‍ය එක්කර පැළ වගා කිරීම සිදුකරන අතර, මෙහිලා කොහුබත් ඉතා හොඳ පෝෂක මාධ්‍යයකි.

## කොහුබත් අපනයනය

වර්ෂ 1977 නි පසු ශ්‍රී ලංකාව විවෘත ආර්ථික රටාවට යොමු වීමත් සමඟ විදේශීය හා දේශීය කර්මාන්ත ව්‍යාප්තියේ වර්ධනයක් ඇති විය. මේ සමඟ දේශීය කර්මාන්ත ආයෝජන අවස්ථා විශාල ලෙස පුළුල් විය. විශේෂයෙන් දේශීය අමුද්‍රව්‍ය යොද කරනු ලබන කර්මාන්තවල විදේශීය ඉල්ලුමට සරිලන ලෙස තරග කිරීමට දේශීය කර්මාන්තකරුවන් උනන්දු විය.

පොල්ගස ආශ්‍රිත අතුරු නිෂ්පාදනයක් වන කොහුබත් කර්මාන්තයේ දී විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කර ගෙන විවිධ නිෂ්පාදන සිදු කෙරේ. අද වන විට විශාල විදේශීය විනිමය ප්‍රමාණයක් රට තුළට ගෙන ඒමට හැකි වී ඇති කොහුබත් ආශ්‍රිත නිෂ්පාදන මඟින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් කුරුණෑගල, පුත්තලම, ගාල්ල, මාතර ව්‍යාප්තියක් දැකිය හැකිය. ශ්‍රී ලංකාව කොහුබත් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කරන ප්‍රධාන රටවල් අතර ඔස්ට්‍රේලියාව, බෙල්ජියම, ඩෙන්මාර්කය, ප්‍රංශය හා ජර්මනිය ප්‍රධාන වේ.

## කොහුබත් කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය

කොහුබත් අපනයන තත්ත්වයට සකස් කිරීම සඳහා මුලින්ම කොහුබත් තැලීම සිදු කරයි. බොහෝ ග්‍රාමීය ප්‍රදේශවල කොහුබත් තැලීම සඳහා කාන්තා ශ්‍රමය යොදගනියි. කොහුබත් වියළීම සඳහා මිදුල් සිමෙන්ති මඟින් සකස්කර අගල් භාගයක් හෝ අගල් කාලක් දැලක් භාවිත කරමින් කොහුබත් අතින් හෝ යන්ත්‍රානුසාරයෙන් තැලීම සිදුකරයි. මෙසේ තලා ගන්නා කොහුබත් නැවත හොඳින් වේළීම සිදු කරයි. ඉන්පසු කොහුබත් ඇසුරුම් කරණය කරයි.

## කොහුබත් ආශ්‍රිත නිෂ්පාදන

01. බ්‍රිකට් **(Bricuttes)**

ග්‍රෑම් 650 ක් පමණ බර දිග 20 cmහා පළල 20cmද උස 5cmකින් යුතු 8.1 අනුපාතයට පීඩනය කරන ලද කොහුබත් කැටයකි. බ්‍රිකට්වල ප්‍රමාණය ගැනුම්කරුවන්ගේ ඉල්ලුම අනුව වෙනස් වේ.

හයිඩ්‍රොලික් තෙරපනය (Hidrolic Press) මඟින් කොහුබත් කැට කිරීම සිදු කරන අතර, අදවන විට බ්‍රිකට් යන්ත්‍ර බේල් යන්ත්‍ර හා බැනර් යන්ත්‍ර යොදගෙන විවිධ හැඩයන්වලට අනුව බ්‍රිකට් සකස් කරයි.

02. කොහුබත් කුට්ටි **(Bales)**

කොහුබත් කුට්ටි 14.5 Kg සිට 25kgදක්වා ප්‍රමාණයන් ගෙන් යුක්ත වේ. සම්මත ප්‍රමාණයේ කොහුබත් කුට්ටිය 30 cm x80cmx15cmප්‍රමාණයන්ගෙන් යුක්තය. පාරිභෝගික අවශ්‍යතා මත මේවායේ හැඩය හා බර වෙනස් වේ.

03. ඩිස්ක්ස්**(Disks)**

පීඩනය කරන ලද කොහුබත් රවුම් ලෙස ඩිස්ක්ස් හඳුන්වයි. ඉල්ලුම්කරුවන්ගේ අවශ්‍යතාව මත මෙහි බර හා හැඩය වෙනස් වේ.

04. පීඩනය කරන ලද වගාමලු **(Grow bag)**

බෝග වගාව සඳහා නිපදවූවකි. විශේෂයෙන් ගෘහස්ථ වගා සඳහා විශාල ඉල්ලුමක් පවතී. මෙම වගාමලු සාමාන්‍යයෙන් 1400kgපමණ බරකින් යුක්ත වේ. 2cmඋස හා 15cmදිගින් ද 100cmපළලින් යුක්ත වේ.

05.කොහුබත් බත්දේසි**(Strips Trag)**

පහසුවෙන් ශාකවල මුල් ඇදගැනීමට සුදුසු ආකාරයට කොහුබත් බත්දේසි සකස් කරයි. පරිසරයට ඉතාමත් හිතකර ලෙස සකස් කර ඇත.

කොහුබත් දැඩි පීඩනයට ලක්කර කොහුබත් බත්දේසි සකස් කරන හෙයින් නැවත නැවත භාවිතයට ගැනීමේ හැකියාව ඇත. මෙම බත්දේසි විවිධ හැඩයන්ගෙන් හා විවිධ ප්‍රමාණයන් ගෙන් යුක්ත වේ.

06. මල් පෝච්චි **(Peat Pots)**

විශේෂයෙන් ගෘහ අලංකාරය සඳහා පරිසරයට හිතකාමී අලංකාර ආවරණයක් ලෙස හඳුන්වයි. ජලය හොඳින් බැස යන පහසුවෙන් එහා මෙහා ගෙන යා හැකි ලෙස සැහැල්ලුවට සකස් කර ඇත.

07. උල්කරන ලද බට **(Bomboo Stakes)**

උල්කරන ලද බට ලෙස එළවළු හා පැළ සිටුවීමට යොද ගනියි.

❑